**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකල විගණන මතය**

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකල මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ආර්ථික තිරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන්  වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩබැලීමේ පත්කිරීමක් කළයුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරකට පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම නොපමාව කළ යුතුය. පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නොවේ නම් 13.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වන බව සඳහන් වුවද 2013 මැයි 02 දින සිට අධ්‍යක්ෂ තනතුරෙහි නිරත නිලධාරීන් දෙදෙනෙකු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීමේ පත්වීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබාදී තිබුණි. වැඩ බැලීමට පත්කල දින සිට 2018 දෙසැම්බර් 31 දක්වාම වැඩ බැලීමේ දීමනා හා එම තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවය මත වැඩ බැලීමේ පත් කිරීම් සිදුකර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක S.C. (FR) 73/2018 ට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති තීරණය පරිදි මේ වන විට 2017.09.26 දින සිට ඔවුන් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියට පත් කර ඇත. |
| **(ආ)** | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අවස්ථා පහත පරිදි වේ.<br><br>(i) සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් නොකිරීම.<br><br>(ii) සමස්ථ කාර්ය මණ්ඩලයේ නිශ්චිතව පැවරුණු වගකීම්වලට අදාලව පවතින නිපුණතා සහ රාජකාරි සාර්ථකත්වය සඳහා | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 පරිදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

පැවතිය යුතු නිපුණතා අතර පරතරය හඳුනා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.

(iii) නිපුණතා පරතරය අවම කිරීම සඳහා ආයතනයට සුවිශේෂී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබීම.

(iv) මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික විය යුතුය. 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සාමාජිකයින් 85 ක ගෙන් සමන්විත වූ අතර, 2018 වර්ෂය තුළදී කාර්ය මණ්ඩල සාමාජිකයන් 32 දෙනෙකු සඳහා පමණක් එනම් සියයට 37 ක් සඳහා දේශීය හා විදේශ පුහුණු අවස්ථා ලබා දී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වියදම් වෙනුවෙන් රු.114,000,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.80,387,712 ක් හෙවත් සියයට 70.5 ක ඉතිරිවීම් පැවති අතර පුනරාවර්තන වැය විෂයයන් 3 ක ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 කට වැඩිවිය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කිරීමට කටයුතු කල යුතුය. | ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ නිල නිවාස 3 ක් අලුත්වැඩියා කිරීමට අවශ්‍ය වුවද ඉන් එකක අපේක්ෂිත වියදම අඩුවීම හා 2 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තු කාර්ය බහුලත්වය නිසා සිදු නොකිරීම මීට හේතු විය.<br>කාර්ය මණ්ඩල පුහුණු කිරීම් යටතේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පමණක් පසු විපරම් හා පුහුණු වැඩමුළු පැවැත්වීමට සැලසුම් කිරීම හා ඊට JICA ආයතනයේ ආධාර මුදලක් ලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

| | | | |
|---|---|---|---|
| | | | ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් සපයන වැඩ සටහන ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන අතර එහි ප්‍රගතිය අත්කර ගැනීම අප පාලනයෙන් බැහැරව පවතී. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයක් යටතේ රු.1,546,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම හා තවත් එක් වැය විෂයයක් යටතේ වෙන්කර තිබූ රු.1,800,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.433,484 ක් හෙවත් සියයට 24 ක් 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරිවීම් ලෙස පැවතුණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කිරීමට කටයුතු කල යුතුය. | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන මිළදී ගැනීම සඳහා 2017 වර්ෂයේ මැද භාගයේ සිටම කටයුතු ආරම්භ කරන ලද අතර එහි පවතින විවිධ ගැටලු හේතුවෙන් මිලදී ගැනීමේ කටයුතු නිමකල නොහැකි වීම නිසා කල්බදු වාරික ලෙස වෙන් කර තිබූ රු.1,546,000 ක ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි විය.<br>භාෂා පරිවර්තන ගාස්තු වෙනුවෙන් අපේක්ෂා කල පරිදි වර්ෂය තුල වියදම් දැරීමට සිදු නොවීම නිසා 24% ක ඉතිරිවීමක් සිදුවිය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයයන් 04 ක මූලික වියදම් ඇස්තමේන්තුවට මු.රෙ.66 මගින් මාරුකිරීම් මුල් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 33 සිට සියයට 63 ක් අතර පරාසයක විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුවේ. | **වැය විෂයන් 04 ක මූලික වියදම් ඇස්තමේන්තු සංශෝධනය**<br>පුරෝකතනයක් සිදු කර නොතිබූ තිරසර සංවර්ධනය පිළිබඳ වාර්ෂික සමුළුව සඳහා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරයෙකු සහභාගි කරවීමට සිදුවීම.<br>දෙපාර්තමේන්තුවේ නිල ඇඳුම් හිමි නිලධාරීන්ගේ ඇබෑර්තු පැවතීම හේතුවෙන් අපේක්ෂා කල පරිදි වියදම් ඇති නොවීම,<br>අපේක්ෂා කල පරිදි ප්‍රධාන අළුත්වැඩියාවන් සිදු නොවීම,<br>කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී නොගැනීම නිසා කල්බදු වාරික ගෙවීමට සිදු නොවීම ඊට හේතු වී තිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

**3.1 සැලැසුම් කිරීම**
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ආ) වගන්තිය ප්‍රකාරව රජයේ දෙපාර්තමේන්තු විසින් සකස් කළයුතු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ | හැකිතාක් දුරට අපේක්ෂිත ඉලක්කයන් නිශ්චිතව සඳහන් කිරීම තුළින් එම ඉලක්ක ලඟාකරගැනීමට කටයුතු මෙහෙයවීම කල යුතුය. | 2018 වර්ෂයට අදාලව සකස් කරන ලද කාර්ය සාධන සැලැස්මෙහි මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදුකෙරෙන ක්‍රියාකාරකම්වල ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම් / ඉලක්ක නිශ්චිතව සටහන් |

| | |
|---|---|
| අදාළ වර්ෂයේ අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Action Plan ), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ඉලක්ක දැක්විය යුතුයි. එසේ වුවද ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය සඳහා පිළියෙළ කළ ක්‍රියාකාරී සැලැස්ම තුළ අපේක්ෂිත ඉලක්ක නිශ්චිතව සඳහන් කර නොතිබුණි. | කිරීමට නොහැකි වී ඇත්තේ, වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවලින් ඇගයීම සඳහා ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා හා නිර්දේශ අපේක්ෂිතව ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධව පුරෝකතනයක් සිදු කිරීම අපහසු බැවින් වන අතර, දෙපාර්තමේන්තුවෙ ආයතන අංශය හා ගිණුම් අංශය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව අදාල කාලරාමු හා අපේක්ෂිත නිමැවුම් පිළිබඳව සටහන් කර ඇත. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාකාරකමක් වූ විශේෂ /ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් සකස් කිරීමට අදාලව දක්ෂිණ සංවර්ධන සැලැස්මෙහි, සලසා තිබූ ප්‍රතිපාදනවලට අදාළව පහත සඳහන් ව්‍යාපෘති සම්බන්ධයෙන් ඇගයීමක් සිදුකිරීමකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම මෙන්ම සංශෝධන සඳහා ද විරුද්ධත්වයක් නොමැති බව අදාළ අමාත්‍යාංශයට දන්වා තිබුණි.<br><br>(i) මාතර දිස්ත්‍රික්කය තුළ රුපියල් මිලියන 554.25 ක වටිනාකමකින් යුතු ව්‍යාපෘති 712 ක් ක්‍රියාත්මක කිරිම.<br><br>(ii) මාතර දිස්ත්‍රික්කය තුළ රුපියල් මිලියන 49.64 ක වටිනාකමකින් යුත් නව ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කිරීම.<br><br>(iii) අනුමත වූ ව්‍යාපෘති අතර මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කට අදාළ ව්‍යාපෘති සංශෝධනය කිරිම. | හැකි සෑම අවස්ථාවකදීම ඇගයීමක් කර නිර්දේශ ලබාදීම තුලින් ව්‍යාපෘතියක ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය. | මේ සම්බන්ධව මෙවැනි ක්‍රියාකාරී සැලැස්මක පවතින කුඩා ක්‍රියාකාරකම් සංඛ්‍යාව එකිනෙක සැලකිල්ලට ගෙන ඇගයීම් වාර්තා පිළියෙල කිරීමට කටයුතු කලේ නම් අධික කාලයක් ගතවන අතර, අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර දී තිබූ එම ව්‍යාපෘති නිසි කාලයට ක්‍රියාත්මක කිරීමට හැකියාව නොලැබීමෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන අදාළ වර්ෂය තුල යොදාගැනීමට නොහැකිවන අතර එවැනි කුඩා ක්‍රියාකාරකම් සියගණන් සඳහා වෙන වෙනම ඇගයීම් වාර්තා සකස් කිරීම ප්‍රායෝගික නොවන බවද නිරීක්ෂණය කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් සැළසුම් ක්‍රමවේද පිළියෙල කිරීම (Preparation of Planning Techniques) යන ක්‍රියාකාරකම 2018 වර්ෂය තුළදී සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් සිදු කිරීමට කටයුතු කල යුතුය. | ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබූ සැලසුම් ක්‍රමවේද පිළියෙල කිරීම (Preparation of Planning Techniques) පිළිබඳව සකස් කර ඇති පොත යාවත්කාලීන කිරීමට මූලා අනුග්‍රහය බාහිර ආයතනයකින් ලබා ගැනීමට සැලසුම් කර තිබුණද, ලබාගැනීමට නොහැකිවීම නිසා එම කාර්ය සිදු කිරීමට නොහැකි විය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහනයක් අළුත්වැඩියා කිරීමට ටොයෝටා ලංකා පුද්ගලික සමාගම ඉදිරිපත් කල රු.865,514 ක් වූ ඇස්තමේන්තුව මිල අධිකවීම හේතුවෙන් ප්‍රතික්ෂේප කර අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සඳහා පමණක් අනුමත ආයතන 3 කින් මිල ගණන් කැඳවා තිබුණි. එම මිල ගණන්වල අවම මිල වූ රු.322,525 කට අලුත්වැඩියාව සිදු කර නොගෙන නැවතත් ටොයෝටා ලංකා සමාගමෙන් පමණක් අවස්ථා 02 කදී මිල ගණන් කැඳවා රු.417,498 ක පිරිවැයකට අළුත්වැඩියාව සිදු කර ගෙන තිබුණි. ඒ අනුව රු.94,973 ක් වැඩියෙන් වැය කර තිබුණි. | එකම කරුණ සඳහා අවස්ථා කීපයකදී ඒකාකාර නොවන ලෙස මිළ ගණන් කැඳවීම සිදු නොකල යුතුය. | අළුත්වැඩියාව සඳහා දේශිය නියෝජිත ආයතනයෙන් මිල ගණන් කැඳවන ලද අතර, එවන ලද ඇස්තමේන්තුව රු.865,514 ක් විය. එම මිල අධික බැවින්, ලියාපදිංචි ගරාජ් වලින් මිල ගණන් කැඳවන ලද නමුත් නැවත දේශිය නියෝජිත ආයතනයෙන් ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස ලද උපදෙස් අනුව නැවත රු.401,010 ක ඇස්තමේන්තුවක් ලබා දෙන ලදී.<br>කල්බදු මෙහෙයුම් ක්‍රමයට වාහනයක් ලබා ගැනිමට උත්සහ කලද එය අසාර්ථකවීම නිසා නැවත ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලදී.<br>එම ඇස්තමේන්තුව රු.417,498 ක් ලෙස වැඩිවී ඇති අතර, පෙර ලබා දී තිබූ නිර්දේශයට යටත්ව, අළුත් ඇස්තමේන්තුව යටතේ නියම අමතර කොටස් යොදා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතිය අනුව ප්‍රසම්පාදන කමිටුවට යොමු කර මෙම අළුත්වැඩියාව සිදුකරන ලදි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 අනුව ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් විසින් කරනු ලබන ප්‍රකාශනයන් දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි කටයුතු කළයුතු වේ. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් විසින් කරනු ලබන ප්‍රකාශයන් ලබා ගැනීමට සටහන් කර ගන්නා ලදී. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම ආයතනයක්ම කටයුතු කළ යුතුව පවතී. ඒ පිළිබඳව දෙපාර්තමේන්තුව දැනුවත්වී අදාල ඉලක්ක හා ක්‍රමෝපායන් සහිතව ආංශික තිරසාර සංවර්ධන ක්‍රමෝපායන් කෘෂි අංශය සඳහා පිළියෙල කර තිබූ අතර අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍ර 08 සඳහා තිරසාර ඉලක්ක හා ක්‍රමෝපාය හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | සෑම රාජ්‍ය ආයතනයක්ම තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රයට"අනුගත වීමට කටයුතු කල යුතුය. | දෙපාර්තමේන්තුව විසින් දැනටමත් පිළියෙල කරන සංවර්ධන ක්‍රමෝපායන් හා ප්‍රතිපත්තීන් තිරසර සංවර්ධනයට අනුගත කරමින් පිළියෙල කරනු ලබයි. කෘෂි අංශය සඳහා පිළියෙල කරන ලද තිරසර සංවර්ධන ක්‍රමෝපායනය මේ සඳහා නිදසුන් වේ. එසේම අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍ර 8ක් සඳහා අදාල තිරසර සංවර්ධන ඉලක්ක හා ක්‍රමෝපාය හඳුනා ගැනීමට මෙම වසර තුල කටයුතු කරමින් පවතී. සෑම ව්‍යාපෘතියක්ම තිරසර සංවර්ධනයට අදාල ඇගයීම් නිර්නායකයන් හා ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර ව්‍යාපෘති ඇගයීමේදී තිරසර සංවර්ධනයට අනුගත වීම ඇගයීම් නිර්ණායකයක් ලෙස නව ව්‍යාපෘති ඇගයීම් පත්‍රයේ ඇතුලත් කර ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 118 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 85 ක් වූයෙන් පුරප්පාඩු 33 ක් විය. එය ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 12 කින්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 02 කින්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 15 කින් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 කින් සමන්විත විය. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට හෝ කටයුතු කළ යුතුය. | පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස මුදල් අමාත්‍යාංශය වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |